**ශ්‍රී ලංකා පදනම - 2020**

-------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

----------------

1.1. තත්වාගණනය කළ මතය

------------------------------

ශ්‍රී ලංකා පදනමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවහා ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් සාරංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධි විධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. රජයේ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ.
මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා පදනමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනයකළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් කළමණාකරනයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයනගේ වගකිම

--------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරිම හා සාධාරණ ලෙස පිළියෙළ කිරීම හා වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමේ දී ආයතනය අඛණ්ඩව පවත්වා ගෙන යාමේ හැකියාව තීරණය කිරිම කළමණාකරණයේ වගකීමක් වන අතර කළමණාකාරිත්වය ආයතනය ඈවර කිරිමට අදහස් කිරිමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදි මෙහෙයුම් නැවැත්විමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩව පැවැත්විමේ පදනම මත ගිණුම් තැබිම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරිමද කළමණාකරණයේ වගකිමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරිමේ වගකිම ,සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ආයතනයේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වන පරිදි ස්වකීය ආදායම්,වියදම්,වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම)

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබා දීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේ දී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමුහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තිය විනිශ්චය සහ වෘත්තිව සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදි.මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනිමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්,ව්‍යාජ ලේඛන සැකසීමෙන්,චේතනාන්විත මගහැරීමෙන් ,වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්යන්තර පාලනය පිළිබඳව අවබෝධයන් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමණාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම අගයන ලදි

- සිද්ධීන් හෝ තත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි.ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළයුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වූවද අනාගත සිද්ධීන් හෝ තත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරිම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත

- තොරතුරු ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයිමට හැකිවන පරිදි එහි සංවිධාන පද්ධතිය, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධතිය, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායි ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නිතීයකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානයකට අනුකූලව ආයතතනය ක්‍රියා කර ඇති බව.

- සිය බලතල කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරිති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම.

| අදාළ ප්‍රමිතියට යොමුව සහිත අනුකූල නොවීම | කළමණාකාරිත්වය අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| (අ) සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණු නමුත් දැනටමත් භාවිතයට ගනු ලබන පිරිවැය රු.14,110,661 ක් වූ විදුලි උපකරණ හා මුළුතැන්ගෙයි උපකරණ වල ඵලදායි ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපිමට කටයුතු කර නොතිබුණි. | මෙම වත්කම් වල අගය 2021 වර්ෂයේ දී නැවත සමාලෝචනය කර නිවැරදි අගයන් ගිණුම්ගත කිරිමට සටහන් කර ගන්නා ලදි. | ප්‍රමිතියේ දක්වා ඇති පරිදි කටයුතු කල යුතුය |
| (ආ) සමාලෝචිත වර්ෂයේ දී වැඩමුළු හා පාඨමාලා ගාස්තු ලෙස ලැබී තිබුණු එකතුව රු.1,875,250ක් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 10 ප්‍රකාරව සේවා ආදායමක් ලෙස හඳුනා නොගෙන ගෙවිය යුතු අත්තිකාරම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.මේ නිසා සමාලෝචිත වර්ෂයේ | බැංකුව වෙත ඍජුවම ලැබූ ප්‍රේෂණ මෙහි ඇතුළත් වී ඇති නමුත් 2020 දෙසැම්බර් 31 දින දක්වා මෙම ප්‍රේෂණ කුමන කරුණක් සඳහා කල තැන්පතු දැයි හඳුනා ගැනීමට අවශ්‍ය සාක්ෂි ලැබී නැත.නිවැරදිව හඳුනා ගත් පසු අදාළ ආදායම් | ප්‍රමිතියේ දක්වා ඇති පරිදි කටයුතු කල යුතුය |

| | | |
|---|---|---|
| ඌනතාවය හා ජංගම වගකීම් එම ප්‍රමාණය වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වල දැක්වුණි. | ගිණුම් වලට බැර කරන බව දක්වා ඇත. | |
| (ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ සමුච්චිත අරමුදල සහ ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය පිළිවෙලින් රු. 6,582,809ක් සහ රු. 530,459,754ක් ලෙස දක්වා තිබුණද ශුද්ධ වත්කම් වෙනස් වීමේ ප්‍රකාශනයේ එය පිළිවෙලින් සමුච්චිත ඌනතාවය රු. 100,686,706ක් හා දායක ප්‍රාග්ධනය රු 637,698,179ක් ලෙස දක්වා තිබුණි. | ප්‍රමිතිය ප්‍රකාශනයේ වෙන් වෙන් අයිතමයන් වශයෙන් ගත් කල ඇති වී ඇති වෙනස ඉදිරි වර්ෂයේ දී සොයා බලා නිවැරදි කිරිමට කටයුතු කරන බව දන්වා ඇත. | අදාළ නිවැරදි කිරිම් කඩිනමින් ඉටු කළ යුතුය |

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වය අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| ආයතනයේ ගනුදෙනුවල ස්වභාවය අනුව නිශ්චිත අඩමාන ණය වෙන්කිරීම් ප්‍රතිපත්තියක් හඳුන්වාදීමෙන් තොරව ණය ගැතියන්ගෙන් වර්ෂ 05 කට වැඩි ණය ශේෂ සඳහා සියයට 100ක අඩමාන ණය වෙන්කිරීමක් ද අනෙකුත් ණයගැති ශේෂය සඳහා සියයට 50ත් සියයට 7.5ක් අතර අඩමාන ණය වෙන්කිරීමක් ද සිදුකර තිබුණි. මේ අනුව සමලෝචිත වර්ෂයේ අවසානයට සිදුකර තිබුණු මුලු අඩමාන ණය වෙන්කිරීම රුපියල් 6,844,605ක් විය. | නිශ්චිත අඩමාන ණය වෙන්කිරීම් ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොමැත. | නිශ්චිත අඩමාන ණය වෙන්කිරීම් ප්‍රතිපත්තියක් සකස්කර ගත යුතුය. |

### 1.5.3 අවිනිශ්චිත ගිණුම්

| විෂය | මුදල | අවිනිශ්චිතව තිබු කාලය | කළමණාකාරිත්වය අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|---|---|
| | රු. | | | |
| අවිනිශ්චිත ගිණුම් | 189,587 | 2015 වර්ෂයේ සිට | මෙම කරුණ සම්බන්ධව කෙරෙමින් පවතින නීතිමය කටයුතු මේ | අවිනිශ්චිත ගිණුම් ඉක්මනින් නිරවුල් කරගත යුතුය. |

වන විට අවසන්ව නොපවතින බැවින් අවිනිශ්චිත ගිණුමේ ඇති ශේෂය නිරවුල් කිරීමට හැකියාවක් නැත.

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමණාකාරිත්වයට අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| 2006 සිට 2009 වර්ෂය දක්වා කාලයට අදාල දේශිය ආදායම් දෙපාර්තමේන්තුවෙන් අයවිය යුතු රු.1,375,812 ක රඳවා ගැනීමේ බදු සමාලෝචිත වර්ෂය දී ද නිරවුල් කර නොතිබුණි. | අවස්ථා ගණනාවකදී මෙම මුදල ආපසු ලබා ගැනීමට උත්සහා කළද එය අසාර්ථක වී ඇත. | දීර්ඝ කාලයක් පවතින මෙම ශේෂය නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුය. |

## 1.7 නීති රීති,රෙගුලාසි සහ කළමානාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති,රිති රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවිම | කළමනාකාරිත්වයේ අදහස් දැක්විම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) රජයේ ප්‍රසම්පාදන මර්ගෝපදේශ සංග්‍රහයේ 4.3.1 (අ) ජේදය. | වටිනාකම රු.3,722,953ක් වූ කායවර්ධන උපකරණ මිලදී ගැනීමේදී සියළුම ආශ්‍රිත වියදම් ඇතුළු මුලු පිරිවැය ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි . | මුල වියදම් ඇස්තමේන්තුවක් වෙන් වෙන්ව පිළියෙල නොවුන ද සමස්ත ඇස්තමේන්තුව වශයෙන් රු.මිලියන 04 ක් ලෙසට ප්‍රාග්ධන භාණ්ඩ ඉල්ලුම්පතෙහි (Req N0 2256) සඳහන්ව ඇත.මේ පිළිබඳව 2019/07/10 දිනැති SLF/TB/2019/09 දරණ ටෙන්ඩර් මණ්ඩල තිරණයේ ද දැනුවත් කර ඇත.මින් ඉදිරි මිලදී ගැනිම් වලදී සියලුම වියදම් ඇස්තමේන්තුව පිළියෙල කිරිමට නිලධාරින්ට උපදෙස් දී ඇති බව දක්වා ඇත. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.10,778,597 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.9,370,945 ක් විය.ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,407,652 ක පිරිහීමක් නිරීක්ෂණය විය.මෙම පිරිහීමට වෙනත් ආදායම් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.** **මෙහෙයුම් සමාලෝචනය**

**3.1** **කළමණාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමණාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ශ්‍රී ලංකා පදනමට නීත්‍යානුකූල අයිතිය පවතින පොත් වටිනාකම රු. 5,283,015 ක් වූ ගොඩනැගිල්ලක් ලිඛිත ගිවිසුමකින් තොරව බාහිර පාර්ශවයන්ට භාවිතය සඳහා ලබා දී තිබුණි. | දිගින් දිගටම ශ්‍රී ලංකා පදනමේ පාලනාධිකාරිය මේ පිළිබඳව අවධානය යොමු කර ඇති අතර අවශ්‍ය කටයුතු සඳහා වගකිව යුතු ආයතන දැනුවත් කොට ඇති බව දක්වා ඇත. | මෙම දේපල පවරාගැනීමට කටයුතු කළයුතුය. |